
**දෙවන වාර පරීක්ෂණය - 2020**
**ලංකා ඉතිහාසය - 13 ශ්‍රේණිය**
**පිළිතුරු - 1 කොටස**

| | | | |
|---|---|---|---|
| (01) - 3 | (11) - 5 | (21) - 3 | (31) - 2 |
| (02) - 1 | (12) - 1 | (22) - 4 | (32) - 4 |
| (03) - 5 | (13) - 5 | (23) - 5 | (33) - 2 |
| (04) - 2 | (14) - 4 | (24) - 2 | (34) - 3 |
| (05) - 4 | (15) - 3 | (25) - 2 | (35) - 5 |
| (06) - 4 | (16) - 1 | (26) - 4 | (36) - 2 |
| (07) - 5 | (17) - 2 | (27) - 3 | (37) - 1 |
| (08) - 3 | (18) - 2 | (28) - 5 | (38) - 3 |
| (09) - 1 | (19) - 5 | (29) - 2 | (39) - 4 |
| (10) - 2 | (20) - 4 | (30) - 5 | (40) - 5 |

## 11 කොටස.

## A කොටස



## B කොටස

02. (i) සිතුල්පව්ව විහාර සෙල්ලිපිය / සංඛපාල විහාර ලිපිය / පල්ලෙ බැද්ද සෙල්ලිපිය / එගොඩපත්තුව සෙල්ලිපිය /වැල්එල්ලුගොඩ කන්ද ලිපිය (මින්1ක් ලියා තිබීම සෑහේ)

(ii) 1. සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් කරුණු සනාථ කරගත හැකිවීම.
2. සෙල්ලිපිවල කරුනු අදාළ සිද්ධියට සමකාලීන වීම.
3. වංසකථාවල නොමැති තොරතුරු මෙන්ම ඒවා පිටපත් කිරීමේදී ඇතිවූ දෝෂ මඟහරවා ගැනීමට. (ල. 4)

(iii) **ආර්ථික තොරතුරු : 1. දේශීය හා විදේශීය වෙළඳාම.**
**තෝනිගල සෙල්ලිපිය -** අතීතයේදී ධාන්‍ය බැංකුවක් පැවති බව/කන්න තුනකට (පිට දඩහස, මදෙහස, අකලහස) යනුවෙන් වගා කටයුතු සිදු කිරීම.
**බදුලු ටැම් ලිපිය :** ගෝපිටිගමුව නගරයේ පැවති වෙළඳපොළක් පිළිබඳ සඳහන්වීම එහි සඳහන් නීතරීති මගින් වෙළඳ කටයුතු පිළිබඳව තොරතුරු අනාවරණය වීම.

**ලබු ඇට බැඳිගල ලිපිය** - වෙළඳ ශ්‍රේණි හා ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සඳහන්වීම.

<u>2. ගොවිතැන් කටයුතු හා වෙනත් කර්මාන්ත</u>

**වෙස්සගිරිය ලිපිය** - එක් එක් කන්නවල වගා කළ යුතු ධාන්‍ය පිළිබඳව රටේ පාලකයා තීරණය කර තිබීම (සිහිනැටි වී මිස මුං නොවපුරනු ඉසා)

ජල සම්පාදනය වෙනුවෙන් අය කළ බෝන පති, දකපති වැනි බවදු වර්ග සඳහන් වීම.

<u>**ලංකාවේ පැවති වෙනත් කර්මාන්ත :**</u>

**කෝන්ගල ලිපිය** - මැණික් කපන්නන් (මණිකර, මෙහිරිය) **පහත මුල්ල ලිපිය** - කුඹකර (කුඹල්කරුවෝ) තුලදර (ස්වර්ණාභරණ නිපදවන) දටික (ඇත් දළ කැටයම්) කබර (යකඩ වැඩ කරන්නන්) පෙහෙකර (රෙදි නිපදවන) ආදීන් පිළිබඳව සඳහන්වීම.

<u>**අධිකරණ තොරතුරු :**</u>

**සිතුල්පව්ව ශිලා ලිපිය** - අධිකරණයෙන් ලද දඩ මුදල් සිතුල්පව්ව විහාරයට පූජා කිරීම.

**වේවැල්කැටිය ශිලා ලිපිය** - ක්‍රි.ව. 10 වන සියවසේ පැවති නීතිරීති පිළිබඳව සඳහන් වීම.

(ආදී විස්තරයට ලකුණු 5)

(iv) සෙල්ලිපිවල සඳහන් දේශපාලනික කරුණු :

* උපරජවරුන් හා ප්‍රාදේශික රජවරුන් - කුසලානකන්ද, හෙන්නන්නේගල, බඹරගල, යටහලෙන ආදී ලිපිවල.

* ඇමති පරම්පරා 5ක් - කදුරුවැව ලිපිය.

* වසභ රජුගේ පුතුන් දෙදෙනා (උතුර, හබැස්ස ලිපිය, දුටග - තම්මැන්නා ලිපිය) මහරජ යන විරුදය දරමින් මෙරට පාලනය කළ බව.

* ක්‍රි.ව. 02 වන සියවසට පෙර පැවති ප්‍රාදේශීය පාලන ඒකක ගැන සෙල්ලිපිවල තොරතුරු ඇතුලත්වීම ඇඹුල් ඇඹේ ලිපිය - පොව්‍ය රජ, යටගහලෙන ලිපිය - දූහතර රජ.

* ශ්‍රී ලංකාවෙ රාජ්‍යත්වය දේශීය වශයෙන් පරිණාමය වී ඇති බව හෙළිවීම - ගමණි, පරුමක, මහරජ යන නාමයන් සෙල්ලිපිවල සඳහන්වීම.

* රජවරුන්ගේ බලය විහිදී ගිය ප්‍රදේශ සඳහන්වීම. වසභ රජුගේ කාලයේදී ඍෂිගිරි ඇමතිවරයා නකදිව (යාපන අර්ධද්වීපය) පාලනය කළ බව වල්ලිපුරම් රන්පතේ දැක්වේ.)

(මේ පිළිතුරට ලියා ඇති ආකාරය අනුව ලකුණු 5ක් ලබාදෙන්න)

03. (i) දෙවනපිය (ල. 1) (ii) දකුණු අකු ධාතුව. (ල. 1)

(iii) යක්‍ෂ, දේව, නාග ඇදහිලි, නැකත් පිළිබඳ විශ්වාස, ගස්, ගල් වන්දනය, බ්‍රාහ්මණ. නිගණ්ඨ ආදී ආගම්, තරු රටා පිළිබඳ විශ්වාස, මළවුන් ඇදහීම. (ආදී කරුණු 4ට ලකුණු 4)

(iv) බුදුදහම ලැබීම හේතුවෙන් සමාජයේ සිදුවූ වෙනස්කම් පිළිබඳව විස්තර කිරීම. භික්‍ෂු ශාසනය ඇරඹීම, ශ්‍රී මහා බෝධිය මෙරටට වැඩම වීමත් සමග 18 ශ්‍රේණියක ශිල්ප ශ්‍රේණීන් මෙරටට පැමිණ විවිධ කර්මාන්ත ඇරඹීම. (වාරිකර්මාන්ත, ප්‍රතිමා නෙළීම, ගෘහනිර්මාණ කලාව ආදී) භික්‍ෂුනී ශාසනය ආරම්භවීම බුදු දහම රාජ්‍ය ආගම බවට පත්වීම කෘෂිකර්මාන්තය ආදී කර්මාන්ත බෞද්ධාගමික මුහුණුවරක් ගැනීම. (අස්වැන්නෙන් මුල් කොටස බුද්ධ පූජාව ලෙස සැකසීම) මේ ආදී විස්තරයට සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න. උපරිම ලකුණු 05කි)

04. * පූර්ව ඓතිහාසික යුගයේ ගම්වැව් ඉදිකිරීම.

* මුල් කාලයේ ගම්වැව් ඉදිකිරීම ගම් නායකයා සතු කාර්යභාරයක් වීම.

* පණ්ඩුකාභය රජු මුල්වරට වැව් ඉදිකළ පාලකයා වීම.

* පණ්ඩුකාභය රජුගේන මෙරට වාරිකර්මාන්ත ක්ෂේත්‍රයට රාජ්‍ය අනුග්‍රහය ලැබීම ආරම්භ වීම.

* ක්‍රි.පූ. 3 වන වන සියවස වන විටත් කුඩා පරිමාණ වැව් දක්නටලැබේ.

* ක්‍රි.ව. පළමුවන සියවසේ වසභ රජුගේ පාලන සමයේදී තාක්ෂණික අංග සහිත මහවැව් තැනීම ආරම්භ වීම.

* ක්‍රි.ව. 5 වැනි සියවස වන විට මහවැව් තැනීම පූර්ණ වීම. (උදාහරණ දක්වන්න)

* ක්‍රි.ව. 7 වැනි සියවසින් පසුව වාරි කර්මාන්ත ක්ෂේත්‍රය අඩාල වීම. (කන්තලේ/ගිරිතලේ වැව්, I අග්බෝ, II අග්බෝ)

* විදේශීය ආක්‍රමණ / දුර්වල පාලනය මෙරට වාරි කර්මාන්ත ක්ෂේත්‍රයට අහිතකර ලෙස බලපෑම.

* අනුරාධපුර රාජධානියබිඳ වැටීමෙන් පසුව මහා පරාක්‍රමබාහු යුගය දක්වා වාරි කර්මාන්තය දියුණු නොවීම.

* දිගුකලක් පැවති ආක්‍රමණ නිසා පැවති ආර්ථික පරිහානිය නිසා I වැනි විජයබාහු රජුට ප්‍රතිසංස්කරණය පමණක් කිරීමට සිදුවීම.

(එකම වැව බුදුගුණවාපි වැව)

05. 1. අනුරාධපුර රාජධානියට එල්ල වූ දකුණු ඉන්දියානු ආක්‍රමණ

* සේන ගුත්තික මොවුන් අශ්ව වෙළෙඳුන් බව මහාවංශයේ දැක්වේ. මොවුන් වසර 22ක් (ක්‍රි.පූ. 237-215) අනුරාධපුරය පාලනයකර තිබේ. සූරතිස්ස රජ දවස මෙය සිදුවේ.

* එළාර ආක්‍රමණය - මොහු දකුණු ඉන්දියානු චෝළ ආක්‍රමණිකයෙකි. ක්‍රි.පූ. 215 දී අසේල රජුගෙන් සිහසුන පැහැර ගෙන වසර 44ක් රට පාලනය කොට තිබේ.

* සත් ද්‍රවිඩ (පංච ද්‍රවිඩ) ආක්‍රමණය - ක්‍රි.පූ. 103 දී වළගම්බා රජ දවස සිදුව තිබේ. පුලහත්ථ, භාහිය පනයමාර, පිළයමාර. දාඨික යන ද්‍රවිඩයන් පස්දෙනා වසර 22ක් රට පාලනය කොට ඇත.

* කරිකාලන් - වංකනාසික සිංහලයන් 12000ක් රැගෙන ගිය බව කියැවේ. මෙය ක්‍රි.ව. 110 - 113 අතර සිදුව තිබේ.

* සය දමිළ ආක්‍රමණය -මින්සෙන් රජ දවස සිදුවී තිබේ. පණ්ඩු, පාරින්ද, චුද්ද, පාරින්ද, තිරීතර, දාඨිය, පීඨිය යන අය ක්‍රි.ව. 434 සිට වසර 27ක් මෙරට පාලනය කර තිබේ.

* ශ්‍රී මාර ශ්‍රී වල්ලභ - මොහු පාණ්ඩ්‍ය රජෙකි. ක්‍රි.ව. 833 දී අනුරාධපුරයේ දෙවන සේන රජ දවස ආක්‍රමණය කොට තිබේ.

* තුන්වන රාෂ්ට්‍රකූට - මොහු ක්‍රි.ව. 956 - 972 සිව්වන මිහිඳු රජ දවස දෙවරක්ලංකාව ආක්‍රමණය කර තිබේ.

* පළමුවන රාජ රාජ - ක්‍රි.පූ. 993 දී මෙම ආක්‍රමණය නිසා රජරට ප්‍රදේශය චෝළ පාලනයට යටත් විය.

* පළමුවන රාජේන්ද්‍ර - ක්‍රි.ව. 1017 දී සිදුවූ මෙම ආක්‍රමණයේදී පස්වන මිහිඳු රජු අල්ලාගෙන චෝළ ප්‍රදේශයට ගෙන ගොස්තිබේ.

2. පළමැනි විජයබාහු රජතුමාගේ විදේශ ප්‍රතිපත්තිය. (අදාළ පිළිතුරට ලකුණු ලබා දෙන්න.)

3. දඹදෙණි යුගයේ සාහිත්‍යය.

*සිංහල, පාලි, සංස්කෘත යන භාෂාවලින් රචිත සාහිත්‍ය කෘති දක්නට ලැබීම. දිඹුලාගල මේධංකර හිමියන්ගේ ප්‍රධානත්වයෙන් ශාසන සංශෝධනයක් ඇති කොට භික්ෂූන් වහන්සේලා විසින පිළිපැදිය යුතු විනය නීති සංග්‍රහයක් සකස් කොට එය දඹදෙණි කතිකාවත නමින් ප්‍රසිද්ධ කරවීම.

* දෙවන පරාක්‍රමබාහු රජතුමා කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන නාමයෙන් හැඳින්වීම එතුමා විසින් කව් සිළුමිණ වනපිණිස, විසුද්ධි මාර්ගසන්නස් ලියවීම, පූජාවලිය, දේව රක්ඛිත ජයබාහු හිමි, සද්ධර්ම රත්නාවලිය ධර්මසේන හිමි විසින් රචනා කිරීම අධ්‍යාපනය නගා සිටුවීමට බෙලිගල කුරුණෑගල ආදී පිරිවෙන් පිහිටුවීම සාහිත්‍ය නිර්මාණකරුවන්ට රාජ්‍ය අනුග්‍රහය ලබාදීම.

සිංහල භාෂාව - සිදත් සඟරාව, යෝගාර්ණවය, කව්සිළුමිණ, පූජාවලිය.

පාලි භාෂාව- හත්තවනගල්ල විහාර වංශය, සමන්තකූට වර්ණනාව, පයෝග සිද්ධි, භෛසජ්ජ මංජුසාව, රසවාහිණිය, සංස්කෘත භාෂාව, දෛවඥ කාමධේනු නම් කෘතිය.

4. කෝට්ටේ යුගයේ අධ්‍යාපනය. (අදාළ පිළිතුර බලා ලකුණු ලබා දෙන්න)

## C කොටස

06. (i) ෆන් එංගල්බෙග් (ල. 1)

(ii) * ප්‍රොතෙස්තන්ත්‍ර හෙවත් රෙපරමාදු ආගම ව්‍යාප්ත කිරීම.

* බෞද්ධ, හින්දු හා කතෝලික ජනයා රෙපරමාදු ආගමට හරවා ගැනීමට දේව ගැතිවරුන් ක්‍රියාකිරීම.

* ඔවුන්ගේ ආගම වැළඳගන්නා අයට තනතුරු, නම්බුනාම හා ප්‍රශංසා ලබාදීම.

* ඉස්කෝල ආරම්භ කොට ආගම් ප්‍රචාරය සඳහා අන්‍යාගමික ළමුන් බෞතීස්මයෙන් පසු පාසැල්වලට ඇතුළත් කර ගැනීම.

* යුරෝපීය දරුවන්ට 'කොළඹ සෙමනේරිය' ආරම්භ කිරීම.

* ගුරුවරුන් පුහුනු කිරීමට නෝමල් පාසැල ආරම්භකිරීම.

* 1739 දී මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දී බයිබලය සිංහලයට පරිවර්තනය කිරීම.

(iii) ලන්දේසීන්ගේ ආර්ථික ප්‍රතිපත්තිඃ

* ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම මගින් ආර්ථික කටයුතු මෙහෙයවීම.

* දේශීය ඉඩම් භුක්ති ක්‍රමය, කුලා ක්‍රමය පදනම් කරගත් සාම්ප්‍රදායික චාරිත්‍ර විධි ප්‍රයෝජනයට ගෙන අඩු වියදමකින් ලාභ ලැබීම.

* කුරුඳු, අලිඇතුන් වෙළඳම, මැණික්, මුතු සම්බන්ධයෙන් වෙළඳ ඒකාධිකාරයක් පවත්වාගෙන යාම.
* උඩරට සමග අභ්‍යන්තර වෙළඳම් කිරීම. ඒ අනුවලුණු, කරවල උඩරටටද, ගම්මිරිස්, බුලත්, කරාබුනැටි, මී ඉටි වෙරළබඩටත් කවලම් මගින් ගෙනයාම.
* ආනයන අපනයන වෙළඳම* දේශීය කෘෂිකර්මාන්තය දියුණු කිරීම.* මුතුරාජවෙල අස්වැද්දීම.
* යෝධ කණ්ඩිය, ඌරුබොක්ක ආදී වැව් ප්‍රතිසංස්කරණය උක්, ඉන්ඩිගෝ, කපු වගා කිරීම.
* බදු අය කිරීම ක්‍රමවත් කිරීමට තෝම්බු සකස් කිරීම, මොරටුවේවඩු කර්මාන්තය පුළුල් කිරීම.
* යුධ වියදම් සීමා කිරීම. (ල. 8)

07. (i) 1. පෙරදිග (ඉංග්‍රීසි) ඉන්දියා වෙළඳ සමාගම යටතේ පාලනය.
2. ද්විත්ව පාලනය 3. බ්‍රිතාන්‍ය කිරීමය යටතේ පාලනය. (ල. 3)

(ii) අවුමිල්දාර්වරුන්. (ල. 1)

(iii) * මදුරාසියෙන් ගෙන්වූ නිලධාරීන් වෙනුවට දේශීය නිලධාරීන් පත්කිරීම.
* භාණ්ඩවලින් බදු ගෙවීමට යෝජනා වීම.
* පොල්ගස් බද්ද වැනි බදු වර්ග අහෝසි කොට ඇතැම් බදු වර්ග සංශෝධනය කිරීම.
ආදී යෝජනා 02 ට (ල. 4)

(iv) 1833 දී ක්‍රියාත්මක කළ කෝල්බෲක් යෝජනා මගින් ඉඩම් මිලදී ගැනීමට එරෙහිව පනවා තිබූ නීති රීති ලිහිල් කළේය. ක්‍රි.ව. 1840 දී මවුබිම් පනත පනවා වසර 30ක අයිතිය සනාථ කළ නොහැකි ඉඩම් රජයට පවරාගැණුනි. මේ යටතේ උඩරට දේශීය ජනතාවගේ බොහෝ ඉඩම් රජයට අයත් විය. මේ හේතුව නිසා උඩරට ඉඩම් අහිමි ජනතාවක් නිර්මාණය විය. දේශීය කෘෂිකර්මාන්තය අභාවයට ගියේය.
කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් උඩරට හා පහතරට ඒකාබද්ධ කිරීම නිසා උඩරටසම්ප්‍රදායික අනන්‍යතාවයට හානි සිදුවිය. සිවිල් ස්වකයෝ වතු වගාවේ නියැලීම නිසා පරිපාලනයබිඳ වැටුණි. රාජකාරි ක්‍රමය අහෝසි කිරීමක් ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියත් නිසා සාම්ප්‍රදායික ඉඩම් භුක්ති ක්‍රමය වෙනස් විය. ගම් සභාව නොසලකා හැරීමනිසා ගැමි ජනයාගේ ප්‍රශ්න උග්‍රවිය. නව අධිකරණ ක්‍රමය නිසා ජනතාව ගැටළු රැසකට මුහුණ දුන්නේය. මේ හේතු වල බලපෑම් වලින් ජන ජීවිතයේ පැන නැගි ගැටළු නිසා ජනතාව නැවත වරක් 1848දී නිදහස් සටනක් ආරම්භ කළේය. (ල. 8)

08. සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ විශේෂ ලක්ෂණ.
ආණ්ඩුකාරයා වෙනුවට අග්‍රාණ්ඩුකාරවරයා පත් කිරීම ඔහු බ්‍රිතාන්‍ය කිරීටයේ නියෝජිතයා විය. ලංකාවේ අගමැතිගේ උපදෙස් පිට බ්‍රිතාන්‍ය රැජිණ විසින් පත් කළේය. අගමැති හා ඇමතිවරු පත් කිරීම, අග විනිසුරු හා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු පත්කිරීම, අගමැතිගේ උපදෙස් මත පාර්ලමේන්තුව කැඳවීම, කල් තැබීම හා විසුරුවා හැරීම රාජාසන කතාව පැවැත්වීම ඔහුට අයත් බලතල හා කාර්ය වේ. ඊට අමතරව සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ අගමැති හා කැබිනට් මණ්ඩලයක් විය. පාර්ලිමේන්තුවද්වි මණ්ඩල විය. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (101) උත්තර මන්ත්‍රීමණ්ඩලය (30) නියෝජිත මන්ත්‍රීවරු ප්‍රාදේශී ඡන්ද කොට්ඨාශ වලින් 95ක්ද සාමකරණයෙන් 06ක්ද පත් කළේය. විධායකය පාලනය කීමනියෝජිත මන්ත්‍රීමණ්ඩලයේ කාර්යයක් වූ අතර, මුදල් කෙටුම්පතක් මාස 6ක් හා සාමාන්‍ය කෙටුම්පතක් වසරක් පමා කිරීමේ බලය උත්තර මන්ත්‍රී මණ්ඩලයට පැවරුන බලතල විය.
මෙහිදී සුළු ජාතීන්ගේ රැකවරණයට විධි විධාන සලසා තිබුණි. බහු මන්ත්‍රී ආසන ක්‍රමය ක්‍රියාත්මක විය. සොල්බරි ව්‍යවස්ථාවට අනුව ලංකා පාර්ලිමේන්තුවට පරමාධිපත්‍යයක් හිමි නොවීමනිසා 1948 දී ලැබූ නිදහස අර්ධ නිදහසක් විය. (ල. 16)

09. 1, 2, 3 ට අදාළ පිළිතුරට ලකුණු ලබාදෙන්න.
4. ශ්‍රී ලංකාවේ හින්දු ආගමික පුනර්ජීවනය
හින්දු භක්තිකයන් සිය ආගම ආරක්ෂා කිරීම වෙනුවෙන් ක්‍රියා කිරීම හින්දු ආගමික පුනර්ජීවයයි. මේ සඳහා ශ්‍රී ආරුමුග නාවලර් තුමා කටයුතු කළේය.
* යාපනයේ හින්දු විද්‍යාලය ඇරඹීම. * ශෛව ප්‍රගාය සභා පිහිටුවීම. * ශෛව විද්‍යාල සාලෙයි නම් ඉංග්‍රීසි මාධ්‍ය පාසල ඇරඹීම. * හින්දු දරුවන්ට පන්ති පැවැත්වීම. * හින්දු දරුවන්ට පොත්පත් රචනා කිරීම පොත් දෙමළ බසට පරිවර්තනය. * උදයභාණු පුවත්පත ඇරඹීම. * පොන්නම්බලම් රාමනාදන් හා පොන්නම්බලම් අරුණාචලම් යන දෙදෙනා ආගමික ව්‍යාපාරය තව දුරටත් ගෙනයාම.